VOICE OF CITIZENS

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

කෙටි විවරණය:

# ශ්‍රී ලංකාවේ ඉඩම් ආශ්‍රිත ගැටුම් සීඝ්‍රයෙන් හඳුනා ගැනීම

**ව්‍යාපෘති මාතෘකාව:**

**ශ්‍රී ලංකාව තුළ දැනුවත් උද්දේශනය සහ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා සිවිල් අවකාශය නිර්මාණය කිරීම**

**ගැටුම් ගතිකත්වය:**

**ඉඩම් අයිති කර ගැනීමට, භාවිතා කිරීමට සහ ප්‍රවේශ වීමට පුරවැසියන්ගේ අයිතිය**

**සාමය ගොඩනගන්නන් විසින් හඳුනාගෙන ඇති ගැටුම් උත්ප්‍රේරක/ගැටුම්කාරී තත්ත්වයන්**

2023 ජූනි

**ක්‍රියාත්මක කිරීම:** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
**අනුග්‍රහය** : UNDP

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඩ විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.


| | |
|---|---|
| **ලිපිනය** | : අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව. |
| **දුරකථන** | : +94112081384, +94112081385, +94112081386 |
| **ෆැක්ස්** | : +94112081388 |
| **විද්‍යුත් තැපැල** | : info@cpalanka.org |
| **වෙබ් අඩවිය** | : www.cpalanka.org |
| **මුහුණුපොත** | : www.facebook.com/cpasl |
| **ට්විටර්** | : @cpasl |

# හැඳින්වීම

දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව ගැටුම් හා ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිවිපාක විඳ ඇත. මීට අමතරව, අවාසනාවකට මෙන්, වසර ගණනාවක් පුරා සමාජ සංහිඳියාවට සහ සහයෝගීතාවයට පිළිසකර කළ නොහැකි බලපෑම් සහ හානි සම්බන්ධ ප්‍රතිවිපාකවල අත්දැකීම් තිබියදීත්, ගැටුම් ප්‍රේරක වැළැක්වීමේ හෝ ඒවාට ප්‍රතිවිරෝධී සාධනීය පියවරවල් ගැනීම නොසලකා හැර ඇත. එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, රටේ සන්දර්භය තුල ගැටුම් යන්නෙහි අරුත බොහෝ දුරට ආරෝපණය කර ඇත්තේ වාර්ගික ප්‍රශ්නයට පමණක් වන අතර එමඟින් ගැටුම් ඇතිවීමට අදාල වෙනත් හේතු හෝ ප්‍රේරක පරාසයන් නොසලකා හැර ඇත.

එය ජනවාර්ගික හෝ වෙනත් හේතුවක් නිසා සිදු වුවද, සමාජයේ විවිධ කොටස්වල අවශ්‍යතා, අදහස්, අභිලාෂයන්, බලාපොරොත්තු, පරමාර්ථ, අපේක්ෂාවන් සහ අරමුණුවල නොගැලපීම් නිසා ගැටුම්කාරී තත්ත්වයන් නිර්මානය වීමේ වැඩි හැකියාවක් ඇත. එවැනි තත්ත්වයන් සෑම විටම සමාජ නොසන්සුන්තාවයට, ආතතීන්ට සහ සමහර විට දේපළ හා ජීවිත අහිමි වීම් වැනි විනාශකාරී තත්වයන්ට හේතු වේ. එමනිසා, ගැටුමේ බලපෑම, එහි පුලුල් අර්ථයෙන් ගත් කල, රටේ පුද්ගලයින්, ආයතන සහ පාලන තන්ත්‍රයන්ට අදාල වාතාවරනවල සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍ර ඔස්සේ නිසැකව බලපෑමකට ලක් විය හැක. තවද, සමාජය තුළ ගැටුම් සඳහා ඇති ඉඩකඩ වැඩි වන විට, සමාජ සහජීවනය, මානව යහපැවැත්ම සහ රටේ සමාජ-ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කිරීමේ අවදානම වැඩි වේ.

මෙම පසුබිම තුළ, කඩිනම් කරුණු සහ දත්ත එකතු කර ගැනීමේ මෙහෙයුමක් මත පදනම්ව මෙම විවරණයෙන් ශ්‍රී ලංකාවේ ඉඩම් ක්ෂේත්‍රයේ ‘ගැටුම් ප්‍රේරක’, ව්‍යාප්තිය සහ විභව ප්‍රතිවිපාක පිළිබඳ දිර්ඝ විස්තරාත්මක නොවන කෙටි විශ්ලේෂණයක් සපයයි. මෙම විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් ගොඩනැගී ඇත්තේ පවතින සහ මතුවෙමින් පවතින ගැටුම් ප්‍රේරක පිළිබඳ සාක්ෂි මත පදනම් වූ රටේ විවිධ ප්‍රදේශවලින් එක්රැස් කරන ලද තොරතුරු මත ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකාරීත්වයට, භාවිතා කිරීමට සහ ප්‍රවේශ වීමට පුරවැසියාට ඇති අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටලු සහ ගැටුම් ගතිකතාවයන් පිළිබඳ තාක්ෂණික සංශ්ලේෂණයක් තුලිනි.

## 1 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටළු සහ ගැටුම් ගතිකත්වය පිළිබඳ සංශ්ලේෂණ වාර්තාව

**වෛද්‍ය රමේෂ් රාමසාමි**

සන්නද්ධ ගැටුම්වලට පෙර, අතරතුර සහ පසුව සාමය, සමාජ සහයෝගීතාවය සහ සහජීවනය ගොඩනැගීම සඳහා භූමිය කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරන බව දැනට පවතින සාක්ෂි විශාල ප්‍රමාණයකින් පෙන්නුම් කරයි. මේ අනුව ප්‍රතිපත්ති නිර්මාණ වලට යොමු ප්‍රජාව, සිවිල් සමාජය සහ ශාස්ත්‍රාලිකයින් අතර ඉඩම් සම්බන්ධ ගැටළු හෝ ගැටුම් නිසා පැන නගින සමාජ ආතතීන් සහ ගැටුම් ආමන්ත්‍රණය කිරීමට ක්‍රම සහ විධි සෙවීමට විශාල අවධානයක් දිනා ගෙන ඇත. රට පුරා ඇති සමාජ, වාර්ගික සහ ආගමික ගැටුම් සඳහා ඉඩම් ප්‍රශ්න ප්‍රමුඛ සාධකයක් වී ඇති බැවින් ඉහත තේමාව අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය සිද්ධිය අතිශයින් වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම් මෙන්ම නැගෙනහිර පළාතේ සහ රටේ අනෙකුත් ප්‍රදේශවල පවතින ගැටුම් අර්ධ වශයෙන් අවුලුවාලීමට හේතු වී ඇත්තේ, ජනතාවගේ ජීවනෝපාය සහ අනන්‍යතාවය ඇතුළු ඇතැම් ප්‍රජාවන්ගේ ඉඩම් අයිතිය අහිමි කරමින අනුප්‍රාප්තික රජයන් විසින් අනුගමනය කරන ලද අසාධාරණ සහ වෙනස් කොට සැලකීමේ ඉඩම් ප්‍රතිපත්තීන්ය.

පවතින සාක්ෂිවලින් පෙනී යන්නේ ලොව පුරා ඉඩම් ගැටලුවලින් විශාල කොටසක් දුර්වල ඉඩම් පරිපාලනය සමඟ සම්බන්ධ වී ඇති අතර එමඟින් පොදුවේ දේශපාලන හා සමාජ ආර්ථික ප්‍රතිසන්ධානය සඳහා පහසුකම් සැලසීම වළක්වන අතර විශේෂයෙන් එය පශ්චාත් ගැටුම් සමාජ ඇතුලත්වේ. එබැවින්, ඉඩම් ගැටළු වල ගතිකත්වය සහ ප්‍රාදේශීය මට්ටමින් සාම ක්‍රියාකාරීත්වය කෙරෙහි ඒවායේ බලපෑම් අවබෝධ කර ගැනීම සඳහා සාක්ෂි පදනම් කරගත් පර්යේෂණ සඳහා විශාල උනන්දුවක් පවතී. එබැවින්, වර්තමාන අධ්‍යයනයෙන් ද අවධානය යොමු කරන ශ්‍රී ලංකාවේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් ඉඩම් ගැටලු, ගැටුම් සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම කෙටි විවරණයෙන් අදහස් කෙරේ. මෙම අධ්‍යයනයෙන් රට පුරා ඇති ඉඩම් ගැටලු ග්‍රහණය කර ගන්නා අතර ඉඩම් ගැටලු සහ ගැටුම් අවුලුවාලීමට සම්බන්ධ විවිධ පාර්ශ්වයන් ඉස්මතු කර දක්වයි. අධ්‍යයනයට අනුව, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 50% කට වැඩි පිරිසකට ඉඩම් ගැටළු සම්බන්ධයෙන් රජයේ ආයතන වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවට හැඟීමක් ඇති බව පෙනේ.

## ඉඩම් සම්බන්ධ ගැටුම් ඇතිවීමට හේතු

පොදුවේ ගත් කල, ඉඩම් අසමානතාවය, අත්පත් කර ගැනීම් සහ වෙනස් කොට සැලකීම යන සියල්ල බොහෝ ගැටුම්වල මූල හෝ ආසන්න හේතුව ලෙස සිවිල් සමාජ, ප්‍රාදේශීය සාමය ගොඩනගන්නන් සහ වෘත්තිකයන් විසින් පුළුල් ලෙස හඳුනාගෙන ඇත. තවද, ශ්‍රී ලංකාවේ මෙන් ප්‍රචණ්ඩ ගැටුම් සහ ඉඩම් ගැටළු, ඉඩම් හිමිකම් උල්ලංඝනය කිරීම්, අසමාන ප්‍රවේශ්‍යතා සහ බෙදා හැරීම් අතර ඇති ශක්තිමත් සම්බන්ධයට විශාල ලෙස සාහිත්‍ය තුලින්ද මතුවේ.. ඉඩම් සහ ස්වභාවික සම්පත් පිළිබඳ ප්‍රතිපත්ති සාම ගිවිසුම් වලදී වැඩි වැඩියෙන් අදාළ වන අතර සාමය ගොඩනැගීම සඳහා ඉඩම් පිළිබඳ ඇ-ඔහ හවුල්කාරිත්වය, ස්වභාවික සම්පත් සහ ගැටුම් වැලැක්වීම සහ 2000 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ, එක්සත් ජාතීන්ගේ 1325 යෝජනාව වැනි එක්සත් ජාතීන්ගේ නිර්දේශ සහ යෝජනා කිහිපයකම ඇතුළත් වේ.. කෙසේ වෙතත්, ඉඩම්, ගැටුම් සහ සාමය ගොඩනැගීම පිළිබඳ දැනට පවතින සාක්ෂි මත පදනම්ව, ශ්‍රී ලංකාවේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් ශක්තිමත් ඉඩම් ප්‍රතිපත්ති සහ නියාමන යාන්ත්‍රණයන් නොමැති බව තර්ක කළ හැකි අතර සමස්තයක් ලෙස ඉඩම් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අසාර්ථක වීමට සහ එය ක්‍රියාත්මක නොකිරීමට හේතු වී ඇත.. වසර 23ක සිවිල් යුද්ධයෙන් පසුවත් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයේ ඉඩම් ප්‍රශ්න සහ ඉඩම් ආශ්‍රිත ගැටුම් නැවත නැවත මතුවන තේමාවන් ලෙස පවතින අතර අනුප්‍රාප්තික රජයන් සංවර්ධන ව්‍යාපෘති නාමයෙන් දේශීය හා ජාත්‍යන්තර ව්‍යාපාරික සමාගම්, ප්‍රභූන් සහ හිතවතුන්ට මෙම ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගැනීමට විවිධ උපාය මාර්ග යොදා ගනිමින් සහයෝගය ලබාදෙමින් සිටියි. මෙම ප්‍රවණතාවය ප්‍රාදේශීය මට්ටමින් සමාජ සහයෝගීතාවය සහ සංහිඳියාව ගොඩනැගීමට ප්‍රධාන බාධකයක් ලෙස පවතින අතර එවැනි තත්ත්වයන් සඳහා මැදිහත්වීම් කිරීමේදී සිවිල් සමාජය අභියෝගවලට මුහුණ දෙයි. යුද්ධය අවසන් වීමෙන් පසු ඉඩම් ගැටලු සම්බන්ධයෙන් විවිධ ආයතන විසින් අධ්‍යයනයන් රාශියක්

සිදු කර ඇති අතර, ඒ සියල්ලෙන් උතුරු නැගෙනහිර ඉඩම් සම්බන්ධ ගැටලුවල විශාලත්වය සහ සාමය, සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය කෙරෙහි ඒවායේ බලපෑම් පැහැදිලිව පෙන්නුම් කරයි. ඉඩම්, බොහෝ දෙනෙකුට, අනන්‍යතා සලකුණක් ලෙස පෙනෙන අතර, මිනිසුන්ට ඉඩම සමඟ යම් ආකාරයක බැඳීමක් ඇත, එබැවින් මිනිසුන් ඉඩම් ගැටළු වලට සංවේදී වේ. සාමය සහ සමාජ සහජීවනය ගොඩනැගීමේ අරමුණින් ඉඩම් ගැටලු විසඳීමට සිවිල් සමාජ ක්‍රියාකාරීන් විශාල උත්සාහයක් ගෙන ඇතත්, දුර්වල ඉඩම් පාලනය, ආයතනික දුර්වලතා, ක්‍රියාත්මක කිරීමේ අසාර්ථකත්වය, දූෂණය සහ ඉඩම් පරිපාලනයේ විවිධ ආකාරයේ අක්‍රමිකතා හේතුවෙන් ඔවුන්ව සීමාවී තිබේ.

## ගැටලුවක් ලෙස "ඉඩම්" දිගටම පැවතීම

පශ්චාත් යුධ සමයන්හී ආන්ඩු වලට මතුවන විශේෂිත දුෂ්කරතාවයක් නම්, ඉඩම් සම්පත් සඳහා ප්‍රවේශය සඳහා වාණිජ හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා මතුවන තරඟකාරී ප්‍රමුඛතා වලට එදිරිව. ජීවනෝපාය, අනන්‍යතාවය සහ ආහාර සහ වෙනත් ආකාරයේ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම සඳහා ඉඩම් සඳහා දේශීය ප්‍රජාවගේ අවශ්‍යතා සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්නයි. එබැවින් රජය දෙපාර්ශ්වයේම අවශ්‍යතාවලට ඉඩ සැලසිය යුතුය, නමුත් බොහෝ විට ශ්‍රී ලංකාව තුළ මෙම ප්‍රමුඛතා දෙක සමතුලිත කිරීම දුෂ්කර ය. මේ අනුව, ශ්‍රී ලංකාවේ තත්වය පෙන්නුම් කරන්නේ ඉඩම් හිමිකම් ගැටලු විසඳීමට දේශපාලන හා ආයතනික හැකියාවක් නොමැතිකමයි. රජය සහ අදාළ බලධාරීන් ඉඩම් ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී දිගින් දිගටම ගැටලු විසඳීමට අපොහොසත් වුවහොත් වැඩි වශයෙන් බෙදුණු සමාජයක් තුල ඉඩම් හිමිකම් ගැටලු සමඟ කටයුතු කිරීමේ ආක්‍රමණශීලී ගැටුම්කාරී ක්‍රම එකතු වීමක් සිදු විය හැක. අප දන්නා පරිදි, ශ්‍රී ලාංකීය සමාජය දැනටමත් නොයෙකුත් ආකාරවලින් ගැඹුරින් බෙදී ඇති බැවින් අනාගතයේ නොවිසඳුණු ඉඩම් ප්‍රශ්නවල තත්ත්වය තවත් නරක අතට හැරෙනු ඇති අතර අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ තරඟකාරීත්වය, අසමානතාවය, ගැටුම්, දුක්ගැනවිලි, අමනාපය සහ සතුරුකම ගොඩනැගීමයි. විශේෂයෙන් එම ප්‍රශ්ණ ආමන්ත්‍රණය කිරීමට සහ කළමනාකරණය කිරීම සඳහා රටේ නීත්‍යානුකූල සහ සාධාරණ නීති පද්ධතියක් නොමැති විට.

ඉඩම් ගැටලු විසඳීමට රජය මුලපිරීමක් ගන්නා විට සම්පත් හිඟය, දුර්වල ඉඩම් ප්‍රවේශය, පාලනය සහ දේශපාලන ගැටලු සහ අනන්‍යතාවය, භූගෝලය, ඉතිහාසය, ජනවාර්ගිකත්වය, දුක්ගැනවිලි සහ ආගම යන ගැටුම් වලට හේතු.වන මූලාශ්‍ර ප්‍රශ්ණ ආමන්ත්‍රණය කිරීමට පහසු වේ. බොහෝ පශ්චාත්-ගැටුම් රටවලට ඉහත ප්‍රශ්න කළමනාකරණය කිරීම සඳහා නීත්‍යානුකූල සහ සාධාරණ ආයතන පිහිටුවීමට හැකි වන අතර, ශ්‍රී ලංකාව ඇතුළු ගැටුම්වලින් පීඩාවට පත් සමහර රටවලට මෙය කළ නොහැක. එබැවින්, සාමය ගොඩනැගීම, සමාජ සහයෝගීතාවය සහ සංහිඳියාව යන සියල්ල භයංකර කර්තව්‍යයන් බවට පත්වී ඇතත්, යුද්ධය අවසන් වීමෙන් පසු බලයට පත් වූ රජයන් ඉඩම් ගැටලු සහ ප්‍රතිසන්ධානය සඳහා යම් පැලැස්තර ක්‍රියාමාර්ග ගෙන ඇතත් - ඒවා බොහෝ විට අසාර්ථක වේ.

ශ්‍රී ලංකාව වැනි ගැටුම්වලින් පීඩාවට පත් රටවල, ඉඩම් ගැටලු විසඳීම සඳහා වගකිව යුතු විධිමත් ආයතනික රාමුව අක්‍රිය බව පෙනෙන නිසාත්, ඵලදායී, නීත්‍යානුකූල ආයතන නොමැති විට ඒ සමඟම ඉඩම් හිමිකම, අත්පත් කර ගැනීම්, මාෆියා හෝ අන්තවාදී ආගමික හෝ ඉඩම් පරිපාලනය සඳහා හමුදාමය සහ දේශපාලන මැදිහත්වීම් වැනි විකල්ප අවිධිමත් ප්‍රවේශයන් ඉඩම් පරිපාලනයේ බලවත් හස්තයන් වී ඇති නිසාත් ගැටලුව වඩාත් සංකීර්ණ හා දුෂ්කර ය. මෙම විකල්ප අවිධිමත් ආයතන අපේ සමාජයේ නිශ්චිත කොටස්වලට (දේශපාලන ක්‍රියාකාරීන්, ව්‍යාපාරික ප්‍රභූන්, ආදිය) අයත් වන අතර, ඔවුන් සාමාන්‍යයෙන් සාධාරණ ලෙස ක්‍රියා නොකරන බැවින් තිරසාර සාමය සහ සමාජ සහජීවනය ළඟා කර ගැනීම සඳහා අනාගතයේදී ඉතා මැනවින් ප්‍රතිස්ථාපනය හෝ නැවත සකස් කළ යුතුය. එපමණක් නොව, ඉඩම් ගැටලු විසඳීම සඳහා ආයතනික ප්‍රවේශයන් නොමැති විට ප්‍රචණ්ඩත්වය, කැරලිකාර, පාතාල මැරයන් සහ විප්ලවාදී දේශපාලනය ඇතුළු විකල්ප සෙවීමට යොමුවේ. අපි පැහැදිලිවම ශ්‍රී ලංකාවේ මෙම ප්‍රවනතා නිරීක්ෂණය කර ඇති අතර වර්තමාන අධ්‍යයනයෙන් එය තවදුරටත් සනාථ වේ. ඉඩම් සම්බන්ධ ඇතැම් නීති යල් පැන ගිය ඒවා බව පෙනෙන අතර, ඒවා අක්‍රිය වීම නිසා ඉඩම් නීති ප්‍රතිසංස්කරණය කිරීම සහ සංශෝධනය කිරීම තුලින් ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීමට වැඩි ඉඩක් ඇත. ස්ථාවර, සාමකාමී සන්දර්භයන් තුළ හොඳින් ක්‍රියාත්මක වන දේ ශ්‍රී ලංකාව වැනි පැතිරී ඇති නොවිසඳුණු ඉඩම් ගැටුම්වලින් පීඩාවට පත් වූ සමාජවල ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියා කිරීම අතිශයින් දුෂ්කර බව ඔප්පු වී ඇති බව ද අප තේරුම් ගත යුතුය. එබැවින් සිවිල් සමාජයට අර්ථවත් මැදිහත්වීම් කිරීමට අවකාශයක් තිබිය යුතු අතර සමාජ සහජීවනය සහ සාමය ගොඩනැගීම සඳහා ඉඩම් ගැටලු විසඳීම සඳහා විවිධ මැදිහත්වීම් අවශ්‍ය වේ.

බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල මෙන්, ව්‍යවස්ථාපිත ඉඩම් අයිතිය ක්‍රමය අබලන් වී ඇති අතර එමඟින් අපයෝජනයන්ට සහ අනුකූල නොවීම්වලට යොමු වේ. දේශපාලන ක්‍රියාකාරීන් සහ බලගතු නිලධාරීන් සහ ව්‍යාපාර ඉඩම් නීති උල්ලංඝනය කිරීමට නැඹුරු වන අතර, ඉඩම් සහ දේපළ සඳහා කළු වෙළඳපොලක් නිර්මාණය කරයි. ග්‍රාමීය ප්‍රජාවන්ට සහ දුප්පතුන්ට අයත් මහා පරිමාණ ඉඩම් අල්ලාගෙන ජාත්‍යන්තර ව්‍යාපාර විසින් ක්‍රියාත්මක කරන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති- මෙම ක්‍රියාවන්ට දේශපාලන ප්‍රභූන්ගේ සහාය ලැබෙන අතර, ආන්තික ප්‍රදේශවල සාමාන්‍ය ජනතාව අවදානමට ලක්වීම දෙස බලන විට එය පැහැදිලි වේ. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව බොහෝ සාකච්ඡා වී ඇතත්, ඉඩම් ගැටලු විසඳන ආකාරය සහ ඉඩම් බෙදාදීම තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමට බාධාවක් බව පෙනේ.

## ඉඩම් පාලනය සම්බන්ධ ගැටළු

වැදගත්ම දෙය නම්, නොවිසඳුණු ඉඩම් ගැටුම් පිළිබඳ ශ්‍රී ලංකාවේ ගැටලුව දුර්වල ඉඩම් පාලනය සමඟ සමීපව බැඳී තිබීමයි. පශ්චාත් ගැටුම් සන්දර්භයක් තුළ එහි සමාජ දේශපාලන මානයන් නොසලකා ඉඩම් පාලනය පිළිබඳ සාකච්ඡා කිරීම දුෂ්කර ය. ඉඩම් යනු වෙළඳ භාණ්ඩයක් නොව, විවිධ කණ්ඩායම් අතර සමාජ දේශපාලන අන්තර්ක්‍රියා හැඩගැසෙන අවකාශයකි. ඉඩම් පාලනය, ඉඩම් සඳහා ප්‍රවේශය සහ එහි භාවිතය පිළිබඳ තීරණ ගන්නා නීති, ක්‍රියාවලි සහ ව්‍යුහයන්, තීරණ ක්‍රියාත්මක කරන සහ බලාත්මක කරන ආකාරය සහ ඉඩම් පිළිබඳ තරඟකාරී අවශ්‍යතා කළමනාකරණය කරන ආකාරය ගැන සැලකිලිමත් විය යුතුයි. එම නිසා, අඩු ආයතනික ධාරිතාව, ගැටුම්-උත්ප්‍රේරක, ප්‍රජාතන්ත්‍රීකරණය, වෙනස් කොට සැලකීම, යල් පැන ගිය අවකාශීය තොරතුරු සහ දත්ත සහ සාමය ගොඩනැගීම සඳහා ජාතික වශයෙන් ජාතික න්‍යාය පත්‍රයේ. අතිශයින් අඩු ප්‍රමුඛතාවයක් ඇති අවස්ථාවලදී බල තුලනය සහ භූමියේ දේශපාලන ආර්ථිකය පිළිබඳ විවාදයක් ඉඩම් පාලනය සම්බන්ධව ඇති කල යුතුය.. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ද ඇතුලත්වේම්. මේ අනුව, පවතින විද්වත් සාක්ෂි අනුව, ශ්‍රී ලංකාව තුළ බොහෝ දුරට නැති ඉඩම් පාලනයේ සන්දර්භීය සහ අන්තර් සම්බන්ධිත සංරචක හයක් ඇත. ඒවා නම් - ඉඩම් පරිපාලනය, ඉඩම් අයිතිය, ඉඩම් ප්‍රවේශ්‍යතාව, ඉඩම් බෙදා හැරීම, ඉඩම් පරිහරණය, ඉඩම් පාදක ධාරිතා ගොඩනැගීම යනාදියයි- මේ සඳහා ඉඩම් පරිපාලනය කිරීමට සහ පැන නගින විවිධ ගැටලු විසඳීමට ශක්තිමත් යාන්ත්‍රණයක් තිබීම ඉතා වැදගත් වේ. එබැවින් ඉඩම් නීති ප්‍රතිසංස්කරණය කරන අතරම ශ්‍රී ලංකාවේ ඉඩම් නීති සහ ප්‍රතිපත්ති වලදී මෙම සංරචක කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර වඩා හොඳ ඉඩම් පාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ පිළිබඳ උද්දේශන ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේදී සිවිල් සමාජයට විශාල වගකීමක් ඇත. අවසාන වශයෙන්, එහි නීති රීති, ක්‍රියාවලි සහ ව්‍යුහයන් අසමානතාවයට සහ වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම, ඉඩම් කොල්ලකෑම වැළැක්වීම, දේශපාලන, ආගමික, මිලිටරි හමුදාවන්, ව්‍යාපාර ආධිපත්‍යය යනාදිය කෙරෙහි අවධානය යොමු කරන්නේ නම්, පශ්චාත්-ගැටුම් ඉඩම් පාලනය දිගුකාලීන සාමය සහ සමාජ සහජීවනය සඳහා පහසුකම් සපයන සාධකයක් විය හැකි අතරම ඉඩම් පරිපාලනයේදී විශාල වගවීමක් සහ විනිවිදභාවයක් ඇතිවේ.

## නිගමනය

අවසාන වශයෙන්, අධ්‍යයනයෙන් පෙන්නුම් කරන පරිදි, කාර්යක්ෂම ඉඩම් පරිපාලනයක් සැපයීම සඳහා නීතිමය හා ආයතනික රාමුවක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. සමහර උත්සාහයන් තිබියදීත්, පශ්චාත් යුධ සමයේ සිට, මෙම භයානක ගැටළු විසඳීම සඳහා ක්‍රියා කර ඇත්තේ අල්ප වශයෙනි. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ස්ථාවරත්වය සහ අනාගත සංවර්ධනය අර්ධ වශයෙන් රඳා පවතින්නේ ඉඩම් සඳහා සාධාරණ, සමාන ප්‍රවේශයක් සැපයීම, ඉඩම් අයිතිය සුරක්ෂිත කිරීම මෙන්ම ඉඩම් සම්බන්ධ ගැටුම් වැළැක්වීම සහ විසඳීම සඳහා අවශ්‍ය නෛතික හා පරිපාලන යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම මත ය. වත්මන් නීති සහ ඉඩම් සම්බන්ධ නීති සම්පාදනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම යන දෙඅංශයෙන්ම මෙම ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්ති ප්‍රජාවට ඔවුන්ගේ තීරණ පදනම් කර ගැනීමට වර්තමාන අධ්‍යයනය ප්‍රයෝජනවත් සාක්ෂි සපයයි. බොහෝ දෙනෙකුට, දැනට කුලී ආරක්ෂාවකින් තොරව ජීවත් වන ඉතා ඉහළ පුද්ගලයින් සංඛ්‍යාවක්, ඉඩම්වලට ප්‍රවේශ වීමේ කුටුම්භවල දුෂ්කරතාවය සහ ඉඩම් ප්‍රවේශ කිරීමේදී සුළු ජාතීන්ට සහ කාන්තාවන්ට එරෙහි ව්‍යුහාත්මක වෙනස්කම් කිරීම් වැනි ගැටළු නව තොරතුරු නොවිය හැකි නමුත් වර්තමාන අධ්‍යයනය තුලින් ශ්‍රී ලංකාව තුළ සාමය, සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය සඳහා අවකාශය නිර්මාණය කිරීම සඳහා විසඳිය යුතු ගැටලු මොනවාද යන්න පිළිබඳව ප්‍රතිපත්ති ප්‍රජාවට වැඩි මග පෙන්වීමක් ලබා දෙමින් එම ගැටලු ප්‍රමාණාත්මකව සඳහන් කිරීමට උත්සාහ කර ඇත..

## 2 වන පරිච්ඡේදය

# හැඳින්වීම


මෙම සාරාංශ විශ්ලේෂණය පදනම් වී ඇත්තේ සමාජ-ආර්ථික සහ දේශපාලන ගැටලු සම්බන්ධයෙන් ගැටුම් උත්ප්‍රේරක සාධක කල්තියා හඳුනා ගැනීම සහතික කිරීම සඳහා වැඩි දියුණු කළ ධාරිතාවක් සහිත සාමය ගොඩනගන්නන් කණ්ඩායමක් විසින් බෙදා ගන්නා ලද දත්ත මතය. මෙම සංක්ෂිප්ත විග්‍රහයේ දී, ගැටුම්කාරී තත්ත්වයන්, සම්බන්ධ පාර්ශවයන්, සමාජ ආතතීන් සහ ප්‍රධාන ගැටුම් උත්ප්‍රේරක වලට ප්‍රධාන කරුණු කෙටි කාලයක් තුළ රට පුරා සාමය ගොඩනගන්නන් විසින් ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව, මෙම සටහන ඉඩම් සම්බන්ධව පවතින ගැටුම්කාරී තත්ත්වයන් පිළිබඳ සවිස්තරාත්මක නොවන විග්‍රහයක් සහ අදාළ බලධාරීහු අවධානය යොමු නොකළහොත් සමාජ ඒකාබද්ධතාවයට අහිතකර ලෙස බලපෑ හැකි සිදුවීම් පිළිබඳ කෙටි සටහනකි. රට පුරා සාමය ගොඩනගන්නන් උප-ජාතික මට්ටමේ උද්දේශන සංවාද නිර්මාණය කිරීමට සහ අර්බුද ප්‍රතිචාර යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කිරීමට මෙම සොයාගැනීම් භාවිතා කරයි.

**සාරාංශ තත්ව විශ්ලේෂණය - ඉඩම් ගැටළු**
**(සාමය ගොඩනගන්නන්ගෙන් ලැබුණු දත්ත මත පදනම්ව)**


| විස්තරය | ප්‍රධාන සොයාගැනීම් |
|---|---|
| ඉඩම් සම්බන්ධ ප්‍රධාන ගැටළු | 1 ඉඩම් ආක්‍රමණය<br>2 ඉඩම් හිමිකම නොමැතිකම / ඉඩම් අයිතිය සොයන විට වෙනස්කම් කිරීම<br>3 ආරක්ෂක අංශ යටතේ පවතින ඉඩම් තවමත් මුල් අයිතිකරුවන්ට නිදහස් කර නැති වීම<br>4 මහා පරිමාණ ඉඩම් විකිණීම (සමාගම්/වැලි කැණීම්/පස් කැණීම් සඳහා)<br>5 ස්වභාවික විපත් හේතුවෙන් ඉඩම්/නිවාස ගැටළු සඳහා තිරසාර විසඳුම් නොමැතිකම<br>6 නාගරික සංවර්ධන/පොදු අරමුණක් සඳහා පුද්ගලික ඉඩම් ප්‍රකාශ කිරීම |
| ඉඩම් ගැටළු ඇති ප්‍රධාන ස්ථාන | අම්පාර, අනුරාධපුර, රත්නපුර, කිලිනොච්චි, වවුනියාව, මුලතිව්, කෑගල්ල සහ මන්නාරම |
| ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව - වාර්ගිකත්වය අනුව | 1. සිංහල සහ. දෙමළ<br>2. සිංහල සහ. සිංහල<br>3. සිංහල සහ. ආදිවාසී<br>4. සිංහල සහ. මුස්ලිම් |
| ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව-ආගම අනුව | 1. බෞද්ධ සහ හින්දු<br>2. බෞද්ධ සහ බෞද්ධ<br>3. බෞද්ධ සහ. ඉස්ලාම් |
| ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව-තෙවන පාර්ශ්ව විසින් | 1. දේශීය සමාගම්<br>2. විදේශීය සමාගම්<br>3. ජාවාරම්කරුවන්<br>4. ආගමික නායකයන්<br>5. දේශපාලනඥයන්ගේ සමීප කණ්ඩායම්/ආධාරකරුවන් |

| | |
|---|---|
| ගැටුම්කාරී තත්ත්වයන්ට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව-ආරක්ෂක හමුදා | 1. යුධ හමුදාව<br>2. යුධ, නාවික සහ ගුවන් හමුදාව<br>3. සිවිල් ආරක්ෂක සහ STF |
| ගැටළු හේතුවෙන් නිර්මාණය වූ ප්‍රධාන සමාජ ආතතීන් | 1. කණ්ඩායම් අතර/සමග ගැටුම්<br>2. පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැර ගැනීම්<br>3. චූදිතයින් /චෝදනා ලද අපරාධකරුවන් විසින් පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂකයන්ට පහරදීම/බලපෑම්<br>4. ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහර දීම |
| ප්‍රධාන ගැටුම් උත්ප්‍රේරක | 1. දේශපාලන හෝ ආගමික නායකයන්ගේ ප්‍රකාශ<br>2. ඕනෑම පාර්ශ්වයකින් වෛරී ප්‍රකාශ කිරීම<br>3. ආරක්ෂක හමුදාවන්ගේ මැදිහත්වීම්/ හැසිරීම්<br>4. නීති විරෝධී/අසාධාරණ පරිපාලන තීරණ<br>5. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මගින් බෙදා හරින ලද තොරතුරු<br>6. සමාජ මාධ්‍ය මගින් සංසරණය වන තොරතුරු |


රූපය 1: ඉඩම් සම්බන්ධ ප්‍රධාන ගැටළු වර්ගය




රූප සටහන 2: ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - දිස්ත්‍රික්කය අනුව





රූප සටහන 3: අම්පාර දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - නිශ්චිත ස්ථානය අනුව





රූප සටහන 4: අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - නිශ්චිත ස්ථානය අනුව





රූප සටහන 5: කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - නිශ්චිත ස්ථානය අනුව




රූප සටහන 6: මන්නාරම දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - නිශ්චිත ස්ථානය අනුව





රූප සටහන 7: වවුනියාව දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ හඳුනා ගත් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් - නිශ්චිත ස්ථානය අනුව





රූප සටහන 8: ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ පාර්ශ්වයන් - වාර්ගිකත්වය අනුව




රූප සටහන 9: ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ පාර්ශ්වයන් - ආගම අනුව





රූප සටහන 10: ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ පාර්ශවයන් - වෙනත් පාර්ශවයන් විසින්




රූප සටහන 11: ගැටුම්කාරී තත්ත්වයට සම්බන්ධ පාර්ශ්ව - ආරක්ෂක හමුදාවන් විසින්



රූප සටහන 12: ගැටුම්කාරී තත්ත්වයට අදාළ ප්‍රශ්නය ඇති කිරීමට/ පවත්වාගෙන යාමට රාජ්‍ය ආයතන සම්බන්ධය?




වගුව 13: ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් නිර්මාණය වූ සමාජ ආතතීන් වර්ග


| ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් නිර්මාණය වූ සමාජ ආතතීන් | නඩු ගණන |
|---|---|
| කණ්ඩායම් අතර/අතර ගැටුම් | 17 |
| කණ්ඩායම් අතර/ අතර ගැටුම් සහ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම් | 3 |
| කණ්ඩායම් අතර/අතර ගැටුම්, පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම් සහ ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහර දීම | 1 |
| කණ්ඩායම් අතර/ අතර ගැටුම් සහ ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහරදීම | 2 |
| කණ්ඩායම් අතර/අතර ගැටුම්, ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහරදීම සහ චූදිත/චෝදනා ලද අපරාධකරුවන් විසින් පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂකයන්ට පහර දීම/බලපෑම | 1 |
| පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම් | 5 |
| පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම් සහ ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහරදීම | 12 |
| පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම්, ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහරදීම සහ පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට එම චූදිත/චෝදනා ලද අපරාධකරුවන් විසින් පහරදීම/බලපෑම | 7 |
| පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම් සහ පුරවැසියන්ට බලපෑම්/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට එම චෝදනා ලද අපරාධකරුවන් විසින් පහරදීම | 1 |
| විරෝධතාකරුවන්ට ආරක්ෂක හමුදා/පොලිස් ප්‍රහාර | 4 |
| ආරක්ෂක හමුදා/පොලිසිය විසින් විරෝධතාකරුවන්ට පහරදීම සහ චූදිත/චෝදනා ලද අපරාධකරුවන් විසින් පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂකයින්ට පහර දීම/බලපෑම | 2 |

| | |
|---|---|
| චූදිත/චෝදනා ලද අපරාධකරුවන් විසින් පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂකයින්ට පහර දීම/බලපෑම | 2 |
| චූදිත/චෝදනා ලද අපරාධකරුවන් විසින් පුරවැසියන්ට/මාධ්‍යවේදීන්ට/මානව හිමිකම් ආරක්ෂකයන්ට පහර දීම/බලපෑම | 1 |
| මෙතෙක් එහෙම දෙයක් වෙලා නැති | 33 |
| මුළු නඩු ගණන | 91 |

14: සමාජ ආතතීන් උත්සන්න කිරීමට හේතු වුන ප්‍රධාන ගැටුම් උත්ප්‍රේරක

1. දේශපාලන හෝ ආගමික නායකයන්ගේ ප්‍රකාශ
2. ඕනෑම පාර්ශ්වයකින් කෙරෙන වෛරී ප්‍රකාශ
3. ආරක්ෂක හමුදාවන්ගේ මැදිහත්වීම්/ හැසිරීම්
4. නීති විරෝධී/අසාධාරණ පරිපාලන තීරණ
5. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මගින් බෙදා හරින ලද තොරතුරු
6. සමාජ මාධ්‍ය මගින් සංසරණය වන තොරතුරු

ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකර ගැනීමට, භාවිතා කිරීමට සහ ප්‍රවේශ වීමට පුරවැසියාට ඇති අයිතිය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටුම්කාරී තත්ත්වයන් හඳුනාගෙන ඇත - 2023 ජූනි



## 3 වන පරිච්ඡේදය

# ජීවන සහ ජීවනෝපාය මාර්ගයක් ලෙස ඉඩම් හිමිකර ගැනීමට, භාවිතා කිරීමට සහ ප්‍රවේශ වීමට පුරවැසියන්ට ඇති අයිතියේ ගැටුම් ගතිකයේ අහිතකර බලපෑම් අවම කිරීම.

ආමන්ත්‍රණය නොකළහොත් සමාජ ආතතීන් ඇති කළ හැකි සහ අන්තර් සහ අභ්‍යන්තර ප්‍රජාවන්ගේ සමාජ ඒකාබද්ධතාවයට අහිතකර ලෙස බලපාන ගැටුම් උත්ප්‍රේරක කල්තියා හඳුනා ගැනීම කාර්යභාරය වූ සාමය ගොඩනගන්නන් විසින් බෙදාගත් දත්ත සහ තොරතුරු සලකා බැලීමෙන් පසුව, විභව අර්බුද ප්‍රතිචාර ප්‍රවේශයන් හඳුනාගෙන ඇත. වඩා හොඳ සිවිල් අවකාශයක් නිර්මාණය කිරීමටත්, ගැටුම් උත්ප්‍රේරක පිළිබඳ සාක්ෂි මත පදනම් වූ තොරතුරු සහ දත්ත සමඟ පුරවැසියන් හොඳින් දැනුවත් කිරීමටත්, සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා විකල්ප අර්බුද ප්‍රතිචාර ප්‍රවේශයන් වෙනුවෙන් පෙනී සිටීමටත් අපේක්ෂා කෙරේ.

මෙම සන්දර්භය තුළ, නොගැලපෙන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග රාශියක් අතර සඳහන් නොවූ නමුත් සාමය ගොඩනගන්නන් විසින් රැස් කරන ලද සාක්ෂි පදනම් කරගත් තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් ලබාගත් ප්‍රධාන විකල්ප අර්බුද ප්‍රතිචාරයන් මෙම විවරණය පහතින් ඉදිරිපත් කරයි.

- ➔ පශ්චාත් යුධ සන්දර්භය තුළ විපතට පත් ප්‍රජාවන් මුහුණ දෙන සහ පුද්ගලික පුරවැසියන්ගේ ඉඩම් අයිතියට අහිතකර ලෙස බලපාන ඉඩම් හිමිකම, භාවිතය සහ ප්‍රවේශය සම්බන්ධ ගැටළු විසඳිය යුතුය.

- ➔ ආරක්ෂක හේතූන් මත ප්‍රවේශය සීමා කර ඇති ප්‍රදේශ තුළ හෝ දේශීයව හඳුනාගෙන ආරක්ෂක කටයුතු සඳහා භාවිත කරන කුඩා ඉඩම් කට්ටි තුළ පිහිටි ඉඩම් සහ/හෝ නිවාස අහිමි වූ සියලුම පවුල් සඳහා ඉතා කාලීන අවශ්‍යතාවක් ලෙස විකල්ප ඉඩමක් සොයා ගැනීම. සහ ඔවුන්ට ලැබිය යුතු ඕනෑම වන්දියක් ද කඩිනමින් ලබාදීම.

- ➔ පුද්ගලික පුරවැසියන්ගේ ඉඩම් අයිතියට ද බලපා ඇති සංවර්ධන ආශ්‍රිත මුලපිරීම් කෙරෙහි බලධාරීන් ප්‍රවේශමෙන් අවධානය යොමු කළ යුතු අතර එවැනි සංවර්ධන අරමුණු සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා සාධාරණ සහ සුදුසු වන්දි ලබා දෙන අතරම ඉවත් කිරීම වලදී පුරවැසියන්ගේ ඉඩම් හිමිකම, භාවිතය සහ ප්‍රවේශය සම්බන්ධයෙන් අයිතිවාසිකම්වලට නිසි ගෞරවය සහතික කළ යුතුය.

- ➔ ස්ථාවර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමේ ඌනතාවයේ සන්දර්භය තුළ මහා පරිමාණ ඉඩම් අත්පත් කර ගැනීම සහ වාණිජ අරමුණු සඳහා භාවිතා කිරීම ඇතුළු ආර්ථික අවශ්‍යතා විසින් නිර්මාණය කරන ලද පුළුල් ඉඩම් සම්බන්ධ ගැටළු බලධාරීන් විසින් විසඳිය යුතුය.

- ➔ පොදු කටයුත්තක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී බලධාරීන් විසින් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සමඟ සාකච්ඡා පැවැත්විය යුතු අතර හේතු පැහැදිලි කිරීමට සහ තොරතුරු සැපයීමට අදාළ කලාපවල උපදේශන ක්‍රියාවලියට පළාත් සභා සහ පළාත් පාලන නියෝජිතයන් ඇතුළත් කර ගැනීම සහතික කල යුතුයි.

- ➔ නොනවතින ඉඩම් අයිතිය, භාවිතය සහ ප්‍රවේශ ගැටළු හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණය, ප්‍රතිසන්ධානය සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ඇති වන බලපෑම ඇතුළු පුළුල් පරාසයක බලපෑම් බලධාරීන් විසින් අදාළ ගැටළු හේතුවෙන් අහිතකර ලෙස බලපාන ප්‍රජාවන් සමඟ අර්ථවත් සාකච්ඡා තුළින් තක්සේරු කළ යුතුය.

- රාජ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම් හරහා පුද්ගලික ඉඩම් පවරා ගැනීම හේතුවෙන් ඉඩම් හිමියන්ගේ නිත්‍ය අයිතිය සම්බන්ධ සුරක්ෂිතභාවය අහිමි වීම සම්බන්ධ ගැටළු වලට මුහුණ දෙන පුද්ගලයින්ට බලධාරීන් විසින් පිළිගත හැකි විකල්ප විසඳුම් ලබා දිය යුතු අතර, ඔවුන්ගේ ජීවනෝපායට සෘජු හා අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සුදුසු ගොවිබිම් ලබා දීමෙන් ගැටළු ආමන්ත්‍රණය කළ යුතුය.

- අදාළ නීතිවල දෝෂ සහිත විධිවිධාන, එවැනි නීතිය උල්ලංඝනය කර ඇති අත්පත් කර ගැනීම් සහ බලහත්කාරයෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් සිදු වූ ඉඩම් අත්පත් කර ගැනීම.

- අත්පත් කර ගැනීම්වලට ලක්ව ඇති ඉඩම් බොහෝමයක් යුද ගැටුම් පැවති ප්‍රදේශවලින් හෝ දශක ගණනාවක් පුරා පාරම්පරිකව හිමිව තිබූ ගොවිබිම්වලින් පැවත එන බැවින් යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ හිමිකම් ලියකියවිලි නොමැතිකම සලකා ඉඩම් නැවත ලබා ගැනීම සඳහා පිළිගත හැකි යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය.

- බලහත්කාරයෙන් ඉවත් කිරීම හරහා ඇති වූ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු, බොහෝ පුද්ගලයන් අවතැන් වීමට සහ නෙරපා හැරීමට හේතු වී ඇති අතර, කිසිදු සහනයක් ලබා ගැනීමට නොහැකි වී ඇත.

- රජය සහ රාජ්‍ය අංශය, පුද්ගලික අංශය, ආදිවාසී ජනතාව සහ ඉඩම් පැවරීමේ සම්ප්‍රදායික පිළිවෙත් ඇති අනෙකුත් ප්‍රජාවන් විසින් දරනු ලබන අයිතිවාසිකම්වල ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා පුද්ගල සහ සාමූහික අයිතිවාසිකම් වාර්තා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පරිපාලකයින් විසින් ශක්තිමත් පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.

- කාලීන අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් නිරාකරණය කිරීම සහ එවැනි ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම ඇතුළුව, කාලෝචිත, සහ ඵලදායී අපක්ෂපාතී සහ ශක්තිමත් අධිකරණ සහ පරිපාලන ආයතන හරහා රාජ්‍යයන් ප්‍රවේශය සැපයිය යුතු අතර පිළියම් සහ අභියාචනා කිරීමේ අයිතිය ලබා දිය යුතුයි. ආරවුල් විසඳීමේ සේවාවන්වලදී, භාෂාව සහ ක්‍රියා පටිපාටි කාන්තාවන් සහ පිරිමින් යන සැමට සමානව ප්‍රවේශ වීමේ අවස්ථාව සැලසිය යුතුය.

- ඉඩම් හිමිකම, භාවිතය සහ ප්‍රවේශය සම්බන්ධයෙන් මතුවෙමින් පවතින ගැටුම්වලට. විසඳුම් සෙවීමට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති හා සැලසුම් දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ජාතික ඉඩම් කොමිෂන් සභාව යන ආයතනවලින් සමන්විත හොඳින් සම්බන්ධීකරණය වූ වගවීමක් සහිතව තීරණ ගැනීමේ සංසදයක් රජය විසින් ස්ථාපිත කළ යුතුය.

- ආයතනිකව හා ක්‍රියාකාරීව ඛණ්ඩනය වී ඇති සහ භූගෝලීය වශයෙන් අසම්පූර්ණ ඉඩම් පරිපාලන පද්ධති සමාලෝචනය කර ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, ඉඩම් පරිපාලනයේ ප්‍රතිපත්ති, සේවා සහ ආයතනික විධාන පිළිබඳ පැහැදිලි බව සහතික කළ යුතුය. ප්‍රතිපත්ති සහ නියාමන වැඩිදියුණු කිරීම් සඳහා කාලය ගතවන බැවින්, අවධානය යොමු නොකළහොත් ගැටුම්කාරී තත්ත්වයන්ට තුඩු දෙන මතුවෙමින් පවතින සහ දිගුකාලීන ඉඩම් ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා වත්මන් ප්‍රතිපත්ති සහ නියාමන රාමුව තුළ බලධාරීන් ප්‍රායෝගික තාක්ෂණික විසඳුම් සහ ප්‍රවේශයන් යෙදිය යුතුය.

VOICE OF CITIZENS

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

www.facebook.com

www.twitter.com

www.youtube.com